Australian Government

Department of Home Affairs

# Status Resolution Support Services Programme
# Repayment Agreement
# තත්ව විසදාලීමේ උපකාරක සේවා වැඩසටහන
# නැවත ගෙවීමේ ගිවිසුම

Form

**1448 SIN**

SINHALESE

## තත්ව විසදාලීමේ උපකාරක සේවා වැඩසටහන (Status Resolution Support Services Programme)

Status Resolution Support Services (තත්ව විසදාලීමේ උපකාරක සේවා (SRSS)) වැඩසටහන මගින් මුදල් උපකාර සහ විවිධ ආකාරයේ උපකාර සේවා ලබාදේ. ඔබ SRSS වැඩසටහනට ඇතුලත්වූ පසු, ඕස්ට්‍රේලියානු රජයේ මානව සේවා දෙපාර්තමේන්තුව (Department of Human Services) (මානව සේවා) වෙතින් SRSS ගෙවීම් ලබා ගැනීමට ඔබට සුදුසුකම් තිබිය හැකිය. මානව සේවා මගින් Department of Home Affairs (ස්වදේශ කටයුතු දෙපාර්තමේන්තුව) (දෙපාර්තමේන්තුව) වෙනුවෙන් SRSS ගෙවීම් සිදුකරනු ඇත. සමහර අවස්ථාවල සීමාසහිත තත්වයන් යටතේ දෙපාර්තමේන්තුව වෙනුවෙන් SRSS සේවා සපයන්නෙකු මගින්ද ගෙවීම් සිදුකල හැකිය.

## නැවත ගෙවීමේ ගිවිසුම යනු කුමක්ද?

නැවත ගෙවීමේ ගිවිසුමක් (ගිවිසුම) යනු ඔබ සහ දෙපාර්තමේන්තුව අතර ඇති එකඟතාවයකි. ඒ මගින් SRSS වැඩසටහන යටතේ වැඩිපුර ගෙවීමක්, කලින් ගෙවීමක් හෝ දෙපාර්තමේන්තුව ගෙවීමට අදහස් නොකල ගෙවීමක් ඔබ විසින් නැවත ගෙවීම අවශ්‍යවේ. ඔබට SRSS වැඩසටහන යටතේ සුදුසසුකම් නැති ගෙවීමක් ලදහොත් මෙම ගිවිසුම යටතේ ඔබ එම මුදල එක්වර හෝ වාරික වශයෙන් නැවත දෙපාර්තමේන්තුවට ගෙවීමට සිදුවේ. එවැනි මුදල් දෙපාර්තමේන්තුව මගින් නීතියෙන් බලාත්මක කල හැකි ආකාරයටද අයකර ගැනීමට අවස්ථාව ඇත.

SRSS වැඩසටහන යටතේ දෙපාර්තමේන්තුව මගින්, ගෙවීම් ඇතුළුව, උපකාර සේවා ලබා දීමට පෙර ඔබ විසින් මෙම ගිවිසුම කියවා අත්සන් කල යුතුය. මෙම ගිවිසුම අවබෝධකර ගැනීමට ඔබට උපකාර අවශ්‍යනම්, භාෂා පරිවර්තකයෙකු පිළියෙල කර ගැනීම සඳහා SRSS සපයන්නෙකු හෝ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හට කථාකල යුතුය.

මෙම ගිවිසුම සම්පූර්ණ කිරීමට පෙර ඔබ *Privacy notice and consent (පුද්ගලිකතා දැන්වීම සහ කැමැත්ත)* ආකෘති 1450 කියවා අවබෝධ කර ගත යුතුය. ආකෘති 1450 දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ **www.homeaffairs.gov.au/allforms/** වෙතින් හෝ දෙපාර්තමේන්තු කාර්යාලවලින් ලබාගත හැකිය.

## ඔබගේ පුද්ගලිකතාව සම්බන්ධ වැදගත් තොරතුරු

ඔබගේ පුද්ගලික තොරතුරු *Privacy Act 1988 (1988 පුද්ගලිකතා පනත)* ඇතුළු නීතීන් මගින් ආරක්ෂා කරදේ. සංවේදී තොරතුරු ඇතුළුව ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කිරීම, භාවිතා කිරීම සහ හෙළිදරව් කිරීම (විදේශ ආයතන ඇතුළුව වෙනත් ආයතන සහ තුන්වන පාර්ශවයන් හට) සම්බන්ධ වැදගත් තොරතුරු ආකෘති 1442i *Privacy notice (පුද්ගලිකතා දැන්වීමෙහි)* හි අඩංගුව ඇත.

1442i ආකෘතිය දෙපාර්තමේන්තු වෙබ් අඩවිය වන **www.homeaffairs.gov.au/allforms/** වෙතින් හෝ දෙපාර්තමේන්තු කාර්යාලවලින් ලබාගත හැකිය.

මෙම ගිවිසුම සම්පූර්ණ කිරීමට පෙර 1442i ආකෘතිය කියවා අවබෝධ කරගත් බවට ඔබ විසින් වගබලා ගත යුතුය.

## මෙම ගිවිසුමෙන් කුමක් අදහස්වේද?

SRSS වැඩසටහන යටතේ අනපේක්ෂිත ගෙවීම් ඔබට ලැබෙන අවස්ථා තිබිය හැකිය. එසේ සිදුවුවහොත්, Human Services වෙතින් වැඩිපුර ගෙවීමක් වශයෙන් හෝ SRSS වැඩසටහන යටතේ කලින් ගෙවීමක් ලැබුවද ඔබ විසින් එවා නැවත ගෙවිය යුතුය.

මෙම ගිවිසුම යටතේ දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් ඔබ විසින් ගෙවීම සම්බන්ධ නෛතික වගකීම් පැහැදිලි කරදේ. එවැනි මුදල් අධිකරණ නියෝගයක් යටතේ ණයක් වශයෙන් ඔබගෙන් අයකර ගත හැකිය. මෙම ගිවිසුම මගින් Human Services හා දෙපාර්තමේන්තුව හට ඔබගේ නිතිපතා ගෙවන SRSS ගෙවීම් මගින් හෝ දෙපාර්තමේන්තුව හට ඇති ණයක් වශයෙන් අධිකරණ නියෝගයක් වශයෙන් හෝ අයකර ගැනීම දෙපාර්තමේන්තුව හට බලය ලබාදේ.

## මෙම ගිවිසුම යටතේ වැඩිපුර ගෙවීමක් (overpayment) යනු කුමක්ද?

ඔබට Human Services වෙතින් වැඩිපුර මුදල් වැරදීමකින් ගෙවන අවස්ථා තිබිය හැකිය. මෙය වැඩිපුර ගෙවීමක් ලෙස හැඳින්වේ. ඔබට වැඩිපුර ගෙවූ විට ඔබ විසින් Human Services වෙත නැවත ගෙවිය යුතුය. හේතු කිහිපයක් මත වැඩිපුර ගෙවීමක් හේතුවෙන් ණයවීම සිදුවිය හැකිය, එවා අතර පහත දේ ඇත:

- මානව සේවා මගින් වැරදි ආකාරයට දත්ත ඇතුලත් කිරීම; හෝ
- ඔබගේ අවස්ථානුගත කරුණුවල වෙනසක් සිදුවී ඔබ Human Services වෙත ඒ බව දැනුම් නොදීම. මේවාට උදාහරණ ලෙස, ඔබට වෙනත් ආදායම් ලැබීම හෝ ඔබගේ සහකරු/සහකාරියගේ  ආදායම දැනුම්දී නොතිබීම හෝ ඔබට වන්දි ලැබී තිබීම; සහ
- බද්ද අවසානයේ ඇති අළුත්වැඩියා ඇතුළුව දේපලට ඔබ හෝ ඔබගේ පවුලේ අය විසින් කරන අලාභහානි.

ඔබට කිසියම් හේතුවකින් ඔබගේ වරදකින් නොව, Human Services හෝ දෙපාර්තමේන්තුවේ වරදකින් වුවද වැඩිපුර ගෙවීමක් කලහොත් දෙපාර්තමේන්තුවට ඇති ණයක් වශයෙන් නැවත ගෙවීම් අයකර ගනු ඇත.

## මට වැඩිපුර ගෙවීමක් කර ඇතිනම් කුමක් සිදුවේද?

ඔබ Human Services හට ණයනම්, පහත දේ ඇතුලත් ලිපියක් ඔබට ලැබෙනු ඇත:

- ඔබ ණයවීමට හේතුව;
- ඔබගේ ණය මුදල;
- ණය මුදල ගෙවිය යුතු දිනය; සහ
- ඔබ විසින් ණය මුදල ගෙවිය හැකි ආකාරය.

ණය මුදල ගෙවිය යුතු දිනට ගෙවූයේ නැතිනම්, ඔබට Human Services වෙතින් නිතිපතා කරන SRSS ගෙවීම් සියයට 5 ක් අඩු කිරීම මගින් ඔබගේ ණය ගෙවීමට ඔබට උපකාර කරනු ඇත. නොඑසේනම්, දෙපාර්තමේන්තුව මගින් ඔබ විසින් ණය මුදල අධිකරණ නියෝගයක් ලෙස අයකර ගත හැකිය.  ණය මුදල ගෙවා අවසාන වනතෙක් ඔබට දෙපාර්තමේන්තුව වෙතින් කලින් ගෙවීම් (පහත බලන්න) ලබාගත නොහැකිවනු ඇත. ඔබට ණය මුදල සම්බන්ධයෙන් හෝ අඩුකරන ලද මුදල සම්බන්ධයෙන් කිසියම් ප්‍රශ්නයක් ඇතිනම්, කරුණාකර ඔබගේ SRSS සපයන්නා හට කථා කරන්න, නැතිනම් දුරකථන අංක 131 202 ඔස්සේ Human Services වෙත කථා කරන්න.

## කලින් ගෙවීමක් (advance payment) යනු කුමක්ද?

කලින් ගෙවීමක් යනු ඔබට සාමාන්‍ය ආකාරයට ගෙවීමක් ලැබෙන දිනයට පෙර ඔබට කරනු ලබන ගෙවීමකි. සීමාසහිත අවස්ථාවල, ඔබගේ SRSS සපයන්නා විසින් ඔබට කලින් ගෙවීමක් සිදුකල හැකිය. කලින් ගෙවීම් සිදු කිරීමට උදාහරණ අතර පහත දේ ඇත:

- මුල් ගෙවීම්;
- කුලිය කලින් ණයක් වශයෙන් ගෙවීම; සහ
- කුලී ඇප ණය.

පහත තත්වයන් යටතේ ඔබට කලින් ගෙවීමක් ලබාගැනීමට සුදුසුකම් නොතිබිය හැකිය:

- ඔබ දැනටමත් කලින් ලබාගත් ගෙවීමක් නැවත ගෙවමින් සිටීනම්; හෝ
- ඕස්ට්‍රේලියානු රජයට ණයක් තිබීම (Human Services සහ දෙපාර්තමේන්තුව මේවාට ඇතුලත්වේ);

© COMMONWEALTH OF AUSTRALIA, 2018

මෙම පිටුව හිතාමතා හිස්ව තබා ඇත

Australian Government
Department of Home Affairs

# Status Resolution Support Services Programme
# Repayment Agreement
## තත්ව විසදාලීමේ උපකාරක සේවා වැඩසටහන
## නැවත ගෙවීමේ ගිවිසුම

Form
**1448 SIN**
SINHALESE

## ණය නැවත ගෙවීම සඳහාවූ ගිවිසුම

Status Resolution Support Services (තත්ව විසදාලීමේ උපකාර සේවා (SRSS)) වැඩසටහන යටතේ කොමන්වෙල්ත් ඕස්ට්‍රේලියා නියෝජනය කරන Department of Home Affairs (ස්වදේශීය කටයුතු දෙපාර්තමේන්තුව) මගින් මූල්‍ය උපකාර සහ උපකාර සේවා රාශියක් ලබාදේ.

එම උපකාර සහ සේවා ලබා දෙන්නේ මෙම ගිවිසුමේ කොන්දේසිවලට යටත්ව පමණි.

මෙම ගිවිසුම අත්සන් කිරීම මගින්, ඔබ දෙපාර්තමේන්තුව සමග නීදියෙන් නලාත්මක කල හැකි එකඟතාවයකට ඇතුලත්වේ.

### 1වන වගන්තිය
**මම පහත දේ අවබෝධ කරගෙන සිටිමි:**

(අ) මට වැඩිපුර ගෙවුයේ නම් හෝ කලින් ගෙවීමක් ලැබුණේ නම්, ණය ප්‍රමාණය මගේ අනාගත SRSS ගෙවීම්වලින් අඩුකර ගනු ඇත.

(ආ) SRSS වැඩසටහන යටතේ පිළියෙල කල නිවසක මා සිටින අතරතුර මම යම් අයෙකුගේ දේපළවලට අලාභහානි කලහොත්, මාගේ අනාගත SRSS ගෙවීම්වලින් ගෙවිය යුතු ප්‍රමාණය සහ වෙනත් අදාල ගෙවීම් අඩුකර ගනු ඇත.

(ඇ) මාගේ වරදින් හෝ Human Services හෝ දෙපාර්තමේන්තුවේ වරදින් මා හට වැඩිපුර ගෙවීමක් ලැබුණහොත්, එම වැඩිපුර ගෙවීම ණයක් වශයෙන් අධිකරණ නියෝගයක් වශයෙන් අයකර ගත හැකිය.

### 2වන වගන්තිය
**මම පහත දේ අවබෝධ කරගෙන සිටිමි:**

(අ) මට Human Services හෝ දෙපාර්තමේන්තුව මගින් ණය මුදල සහ ණය ගෙවියයුතු දිනය දැනුම් දෙනු ඇත.

(ආ) මට නියමිත දිනට ණය සම්පූර්ණයෙන් ගෙවිය නොහැකි නම්, මා විසින් Human Services හෝ දෙපාර්තමේන්තුව සමග සම්බන්ධවී අනාගතයේදී මට හිමි SRSS ගෙවීම්වලින් අඩු කර ගැනීමට Human Services සමග එකඟතාවයකට පැමිණිය යුතුය.

(ඇ) ණය ප්‍රමාණය අඩු කිරීම් වශයෙන් නැවත ගෙවීමට එකඟතාවයකට පත්වුණි නම්, එම අඩු කිරීම්වල ප්‍රමාණය සහ දිනයන්ද, අඩු කිරීම ආරම්භ කරන දිනයද මා හට දැනුම් දෙනු ඇත.

### 3වන වගන්තිය
**Human Services සහ දෙපාර්තමේන්තුව හට මාගේ බලය ලබා දීම:**

(අ) මම Human Services හෝ දෙපාර්තමේන්තුව සමග එකඟතාවයකට පැමිණියේ නැතිනම්, මා විසින් මට වැඩිපුර කරන ලද ගෙවීමක්, කලින් ගෙවීමක් හෝ වෙනත් මුදලක් මාගේ අනාගත SRSS ගෙවීම්වලින් සියයට 5කට වැඩි නොවන ආකාරයට අඩුකර ගැනීමට Human Services වෙත මම බලය ලබා දෙමි.

(ආ) SRSS වැඩසටහන යටතේ මා විසින් ණයවූ මුදලක් මාගේ SRSS ගෙවීම්වලින් සියයට 5කට වැඩි නොවන ප්‍රමාණයකින් අඩුකර ගැනීමට මම Human Services සහ දෙපාර්තමේන්තුව හට බලය ලබා දෙමි.

(ඇ) (3)වන වගන්තිය යටතේ ඇති අනුපාතයට මා විසින් ණය මුදලක් අඩුකර ගැනීමට ඉඩ දීමට නොහැකි නම් මම මාගේ SRSS සපයන්නා සහ Human Services හට මා හට ගෙවීමට නොහැකි බව දැනුම් දෙනු ඇත.

### 4වන වගන්තිය
**පුද්ගලික තොරතුරු හෙළිදරව් කිරීම සහ බලය ලබාදීම**
**මම පහත දේ සම්බන්ධයෙන් බලය ලබා දෙමි:**

(අ) ණය නැවත ගෙවීම හෝ ණය පියවා ගැනීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් Human Services සහ දෙපාර්තමේන්තුව හට මෙම ගිවිසුම යටතේ අවශ්‍ය සියළුම විමසීම් කිරීමට.

(ආ) SRSS වැඩසටහනේ අරමුණු සම්බන්ධයෙන් Human Services සහ දෙපාර්තමේන්තුව ඕනෑම පුද්ගලික තොරතුරක් භාවිතා කිරීම හෝ පහත අය හට හෙළිදරව් කිරීම:

i. මානව සේවා සහ දෙපාර්තමේන්තුව අතර;
ii. ප්‍රාන්ත සහ කොමන්වෙල්ත් රජයේ ආයතන;
iii. මගේ SRSS සපයන්නා; සහ
iv. අධිකරණ ඇතුළුව නීතිය ක්‍රියාත්මක කරන ආයතන.

Please print this form and complete it in English using a pen and BLOCK LETTERS.
Tick where applicable ✓

කරුණාකර මෙම ආකෘතිය මුද්‍රණය කර පෑනක් භාවිතා කර මුද්‍රිත අකුරින් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කරන්න.
අදාල ආකාරයට සලකුණු කරන්න. ✓

## Undertaking
## භාරගනු ලබන දේ

**Individual's details –** ***to be completed by the individual***
**පුද්ගලයාගේ විස්තර - පුද්ගලයා විසින් සම්පූර්ණ කල යුතුය.**

**1** Individual's full name (BLOCK LETTERS)
පුද්ගලයාගේ සම්පූර්ණ නම (මුද්‍රිත අකුරින්)

Family name
සම්පූර්ණ නම

Given names
සම්පූර්ණ නම

Date of birth
උපන් දිනය
Day දිනය / Month මාසය / Year මාසය

Person's ID
පුද්ගලයාගේ හැඳුනුම් අංකය

ImmiCard number *(if applicable)*
ImmiCard අංකය *(අදාල නම්)*

© COMMONWEALTH OF AUSTRALIA, 2018

**2** Acknowledgement

I understand that:

- this Agreement is an arrangement between the Commonwealth of Australia and me.
- the law applying to this Agreement is the law of the Australian Capital Territory (ACT).
- this Agreement can be enforced against me in a court with jurisdiction under the law of the ACT.
- by signing this Agreement, I accept the terms of the above from the Commonwealth of Australia as a legally enforceable arrangement.

පිළිගැනීම

මම පහත දේ අවබෝධ කරගෙන සිටිමි:

- මෙම ගිවිසුම මා සහ කොමන්වෙල්ත් ඕස්ට්‍රේලියා අතර එකඟතාවයකි.
- මෙම ගිවිසුමට අදාල නීතිය ඕස්ට්‍රේලියන් කැපිටල් ටෙරිටරි (ACT) හි නීතියවේ.
- මෙම ගිවිසුම ACT නීතිය යටතේ අධිකරණ බලය ඇති අධිකරණයකින් මට විරුද්ධව බලාත්මක කල හැකිය.
- මෙම ගිවිසුම අත්සන් කිරීම මගින්, ඕස්ට්‍රේලියානු කොමන්වෙල්ත් මගින් ඇති කොන්දේසි නීතියෙන් බලාත්මක කර හැකි ලෙස මම පිළිගනිමි.

**Signature of individual**
**පුද්ගලයාගේ අත්සන**

Date දිනය: Day දිනය / Month මාසය / Year මාසය

**3** Was an interpreter used?
භාෂා පරිවර්තකයෙකු උපකාරකර ගත්තේද?

No නැත ☐ ▶ You do not need to complete any more questions. Return this completed Agreement to your case worker.

ඔබ විසින් තව දුරටත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු නැත.

ඔබගේ කටයුත්ත සම්බන්ධයෙන් ක්‍රියා කරන අය හට සම්පූර්ණ කල ගිවිසුම නැවත භාර දෙන්න.

Yes ඔව්. ☐ ▶ **If an interpreter was used in the preparation of this Agreement**, the interpreter must complete their details on page 4.

The interpreter's details must be confirmed by the individual.

**මෙම ගිවිසුම පිළියෙල කිරීමේදී භාෂා පරිවර්තකයෙකු උපකාර කර ගත්තේ නම්,** භාෂා පරිවර්තක විසින් 4වන පිටුවේ ඇති විසතර සම්පූර්ණ කල යුතුය.

භාෂා පරිවර්තකගේ තොරතුරු පඑද්ගලයා විසින් සනාථ කල යුතුය.

## Interpreter's details – *to be completed by the interpreter*
## භාෂා පරිවර්තකගේ තොරතුරු - *භාෂා පරිවර්තක විසින් සම්පූර්ණ කල යුතුය*

**4** Interpreter's full name (BLOCK LETTERS)

Family name

Given names

Address (a work address is sufficient)

Postcode

TIS number

Language

**5** Certification

- I have accurately interpreted the contents of this Agreement to the person and checked their understanding prior to them signing.
- I am aware of the confidentiality clause under which I have been engaged and agree to not disclose any information contained in this Agreement.
- I understand the English language and the language used for interpretation and I have truly interpreted the contents of this Agreement.

**Signature of Interpreter**

Date: Day / Month / Year

## Confirmation of interpreter's details – *to be completed by the individual*
## භාෂා පරිවර්තකගේ තොරතුරු සනාථ කිරීම - *පුද්ගලයා විසින් සම්පූර්ණ කල යුතුය*

**6** I, (individual's full name – BLOCK LETTERS)
මම, (පුද්ගලයාගේ සම්පූර්ණ නම - මුද්‍රිත අකුරින්)

through the interpretation of (interpreter's full name – BLOCK LETTERS)
(භාෂා පරිවර්තකගේ සම්පූර්ණ නම - මුද්‍රිත අකුරින්) භාෂා පරිවර්තක මගින්

confirm that the interpreter has first declared that he/she has truly interpreted the contents of this Agreement.
ප්‍රථමයෙන් ඔහු/ඇය මෙම ගිවිසුමේ අඩංගු දේ සත්‍ය වශයෙන් පරිවර්තනය කල බව ප්‍රකාශ කර බව ප්‍රකාශ කරමි.

**Signature of individual**
**පුද්ගලයාගේ අත්සන**

Date දිනය: Day දිනය / Month මාසය / Year මාසය


© COMMONWEALTH OF AUSTRALIA, 2018